පසුව ඝාතනය වීමේ වරපුසාදය

රෝහිත භාෂණ අබේවර්ධන
ගිරු කණ්ඩායම

ජාත්‍යන්තර මානව හිමිකම් දිනය යෙදී තිබුණේ දෙසැම්බර් 10 වෙනිදාටය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යළි බල ගන්නලු ලැබුණේ දෙසැම්බර් 06 වෙනිදාය. මේ අනුව කොළඹ සති අන්ත 'ජාතික පත්තර' මානව හිමිකම් දිනය සමරා ලිපි හා ඡේදා රූප පළ කොට, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පසසා කතුවැකි ලිවූහ.

දෙසැම්බර් 07 වෙනිදා ජාතිය අමතා කතාකළ ජනාධිපති රාජපක්ෂ 'බය සිටිය යුත්තේ ත්‍රස්තවාදය සමගද, පොදු මහජනයා සමගද යන්න ඔබ තීරණය කරන්න. මෙම දෙපිල නිශ්චිතව තෝරා

1984 නොවැම්බර් 08 වෙනිදා දෙනියායේදී ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් 23 දෙනෙකු හදිසි පොලිස් වැටලීමකින් අත්අඩංගුවට ගනු ලැබ මාතර බන්ධනාගාරයට ගාල් කරනු ලැබිණ. 'කොටි පනතේ' බිහිසුණු වගන්ති සිංහලයින්ට එරෙහිව ක්‍රියාත්මක වීම පෙරට ආවේ එපරිද්දෙනි.

බේරාගන්න. කිසිවෙකුට එකවර මේ දෙපිල නියෝජනය කළ නොහැකියැ''යි කීවේය. 'ත්‍රස්තවාදයට එරෙහි තමන්ගේ ගෝලීය සංග්‍රාමය' ආරම්භ කරමින් 2001 සැප්තැම්බර් 20 වෙනිදා සෙනෙට් සභාවේ ඊකාබද්ධ සැසිවාරය සහ අයමෙරිකානු ජනතාව අමතා ජනාධිපති බුෂ් මෙසේ කීවේය, ''එක්කෝ ඔබ අපි සමගය. නැතහොත් ත්‍රස්තවාදීන් සමගය. ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේදී නිර්පාක්ෂික නිශ්ක්‍රියතාවට ඉඩක් අත්තේ නැත.''

මේ අනුව දැන් අපට අයමෙරිකානුවන් ගිය අඩි පාර හමු වී තිබේ. හමුත් අයමෙරිකානුවන්ට වඩා වෙනස් ඉරාණමක් ඒ පාරේදී අපට හමුවෙතැයි බොහෝ දෙනා අදහති. මේ ලිවීමේ අරමුණ ඒ අදහසිල්ලට බාධා කිරීම නොවේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 1979දී ගෙන එන ලද්දේ ජයවර්ධන විසිනි. ඒ උතුරේ ත්‍රස්තවාදය හය මාසයකින් අතුගා දැමීමේ කාර්යය පහසු කරනු පිණිසය. ඒ වනවිටත් ජයවර්ධනගේ බෑණා වූ බ්‍රිගේඩියර් වීරතුංග උතුරේ සය මාසික ශුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු අරඹා තිබිණ. යාපනයේ මාවත් අද්දර තරුණ මළ සිරුරුද කඳු ගැසිණ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලබන්නේ 'කොටි' නැවතත් සාමාන්‍ය ජනතාව එය 'කොටි පනත' වීය. ඒ වචනය නිෂ්පාදනය කරන ලද්දේ කොළඹ පත්තර විසිනි. කොටි මඩින පනත් ගැන අපි කුමට කලබල වෙමුදැයි සිතූ බොහෝ දෙනා තම තමන්ගේ කටයුතු පාඩුවේ කරගත්හ.

1983 ජූලි මස 30 වෙනිදා හදිසි නීති 68 වන රෙගුලාසියේ පළමු ඡේදය යටතේ ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකාවේ කොම්යුනිස්ට් පක්ෂය සහ නව සම්මත පක්ෂය තහනම් කරමින් ජයවර්ධන දකුණට යුද්ධ ප්‍රකාශ කළේය. අපි සහ කොටි වශයෙන් විභේදනය වූ බහුතර සිංහලයාගේ මානසික ලෝකය පුපුරා යාම ඇරඹුණේ ඉක්මතිනිය. 1984 නොවැම්බර් 08 වෙනිදා දෙනියායේදී ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් 23 දෙනෙකු හදිසි පොලිස් වැටලීමකින් අත්අඩංගුවට ගනු ලැබ මාතර බන්ධනාගාරයට ගාල් කරනු ලැබිණ. 'කොටි පනතේ' බිහිසුණු වගන්ති සිංහලයින්ට එරෙහිව ක්‍රියාත්මක වීම පෙරට ආවේ එපරිද්දෙනි. 1985 පෙබරවාරි 12 වෙනිදා නිකුත් කළ නිවේදනයක ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය මෙසේ ළිඟවිය: ''ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින්ය යන චෝදනාව යටතේ පුද්ගලයින් 23 දෙනෙකු අත්අඩංගුවට ගැනීම පිළිබඳ ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයේ විශේෂ අවධානය යොමුව අත්තේ දකුණේදී ආණ්ඩුවේ දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මුල් වරට යොදාගත් බවට වාර්තා වන්නේ මෙම අවස්ථාවේදී බැවිනි.''

අනතුරුව දෙවසරක් අතඟළත දකුණ ඝාතකාගාරයක් බවට පෙරළිණ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේම සිංහල තරුණ-තරුණියන්ද අත්අඩංගුවට ගෙන මරා දැමීමට බලය සැපයෙන බව දකුණේ බහුතරයක් සිංහලයින් වන්නන් ගත්තේ පාවළුේ අද්දර ප්‍රපැස්සා දැමුණු මිනී කඳුවළ දුමාරය බැලිනි. අතුණකොළපැළෙස්සේ පුජා ගාලාවේද, මාතර තලල්ලේ කම්කරු වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේද, ඔරුවල වානේ සංස්ථාවේ පුහුණු ආයතනයේද, හපුතලේ බෝරගල 'සමේ ෆැක්ටරි' ඇතුළේ කම්හලේද, ලුමුල්ලේ පැල්වැත්ත රජයේ ගොවිපොළේද, පොල්ගොල්ලේ සමුපකාර විද්‍යාලයේද, මීරිගම යොමුන් නිකේතනයේද, මාතර එළියකන්දේද, ඕසුල්ලේ හාලිඇඳ මෝටර්ස් ගරාජයේද, කොළඹ සරසවි නීති පීඨයේද ආදී බොහෝ තැන්වල පවත්වාගෙන යනු ලැබූ නීත්‍යනුකූල වධකාගාර සඳහා බලපත් සැපයුණේ ඒ 'කොටි පනත' හරහාය.

ජනතා විමුක්ති පෙරමුණ එවකදී ජයවර්ධන ආණ්ඩුව සමග, ප්‍රේමදාස ආණ්ඩුව සමගත් කවර හෝ ආකාරයක ගනුදෙනුවකට එළඹීම සඳහා පනවනු ලැබූ අභිචාරීය කොන්දේසිවල මුදලේම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ වගකීමෙන් ආරක්ෂා කිරීමේ පනත අහෝසි කිරීමේ කොන්දේසිය ස්ථානගත කරන්නට අමතක නොකළේය. 'ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදයට අනුබල නොදෙන කිසිවෙක් මේ පනත් ගැන කැලඹල වීය යුතු නැත'යි ජයවර්ධන-ඇතුළත්මුදලි ආණ්ඩුවද, ප්‍රේමදාස-රණත්න විජේරත්න ආණ්ඩුවද ජාතිය අමතමින් එලැස කීහ. නමුත් 60,000ක් තරුණ ජනයා සමූල සංහාරය කළ ලාංකීය ඉතිහාසයේ ලේ වැකි පිටිවිජේදයන් ලියන ලද්දේ මේ මිනිස් ඝාතක පනත් රෙගුලාසි මගින් සැපයුණු ආවරණය යටතේය.

සංහාරයන්ගෙන් පසු 1991 සැප්තැම්බර් 01 වෙනිදා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලයේ වගකීමේ ටිපුවතලදී සිට සෝමවංශ අමරසිංහගේ අත්සනින් නිකුත් කරන ලද නිවේදනයක් මගින් 'ශ්‍රී ලාංකීය ජනතාවට අතිශි කර ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් යළි ස්ථාපිත කිරීමට' වහාම ගත යුතු ක්‍රියාමාර්ග හතරක් දක්වා තිබිණ. එහි පළමු ක්‍රියාමාර්ග තුන මෙසේය: **'' හදිසි නීතිය අත්හළ සියලු මේදනතරෝ නීති ඊති අහෝසි කළ යුතුය. - සියලුම දේශපාලන සිරකරුවන් සොන්දේසි විරහිතව නිදහස් කළ යුතුය. - උපස්ථ අනුශාසක ලබන ඝාතක කණ්ඩායම් නිරායුදු කර විසුරුවා ජන ඝාතකයන් නීතියට ඉදිරියට පැමිණවිය යුතුය.''**

එයින් දෙමසක් ඇතුළතදී නොවැම්බර් 30 වෙනිදා පසසයේ ප්‍රධාන ලේකම්වරයාගේ ගරාකමින් සෝමවංශ අමරසිංහ විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් යැවීය. එහි 'ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට' ගත යුතු ක්‍රියාමාර්ග 7ක් දක්වා තිබේ. එහි 5.1 සහ 5.2 ඉල්ලීම් මෙපරිදිය: 'හදිසි නීතිය, ත්‍රස්තවාද විරෝධී පනත යටතේ ක්‍රියාත්මක කර ඇති මේදන නීති සහ වෙනත් මේදන නීති ඉවත් කළ යුතුය - ශ්‍රී ලංකාවේ සෑම පළාතකම කෙරෙන හමුදා, පොලිස් මෙහෙයුම් වහා නතර කළ යුතුය.'

මේ සියලු උපදා දැක්වීම්වල මූලික තර්කය සරළ එකකි. එනම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම එකකට එකක් නොපැහේ, එක්කෝ එවැනි පනත් හකුළා දැමිය යුතුය. නැතහොත් ප්‍රජාතන්ත්‍රවාදය හකුළා දැමිය යුතුය.

වසර 2500ක මහා ඉතිහාස වංශ කතාව වමාරා කමින් කට පාඩම් කොටගත් සමාජයකට දත-පහළොස් වසරක ඉතිහාසය අමතකව ගොස් තිබේ.

1994 අගෝස්තු මහ මැතිවරණයේදී ජාතිය ගලවාගැනීමේ පෙරමුණ නමින් මැතිවරණ තරග බිමට පිවිසුණු වර්තමාන ජනතා විමුක්ති පෙරමුණ 'ජාතිය ගලවාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණේ මැතිවරණ ප්‍රකාශනය' මගින් තමන්ගේ ජාතිය ගලවාගැනීමේ වැඩ පිළිවෙළ එළිදැක්විය. එහි දේශපාලන සෙත්තු සඳහා වෙන් කොට ඇති කොටසේ 4 වැනි වගන්තිය මෙසේය: ''ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතත්, අපරාධවලින් බේරීමේ පනතත් එවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී හා මූලික මිනිස් අයිතීන් අහෝසි කරන අණ පනත් සියල්ලත් අහෝසි කරනු ලැබේ.''

එහිම 11 වෙනි සහ 15 වෙනි වගන්තීන් පිළිවෙළින් මෙබඳුය: ''සියලුම නීති විරෝධී සන්නදීධ හමුදා සහ මෙර කණ්ඩායම් වහාම විසුරුවා හැර ජනතා අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබේ. මේදන යන්තයේ ඇංගයන් ළෙය පැවති වර පුරුෂ සේවාවන් වහාම අහෝසි කෙරේ. ඒවායින් මෙතෙක් සිදුකර ඇති සියලු කටයුතු විධිමත් පරීක්ෂණයකට භාජනය කෙරෙනු ඇත. ඒ සඳහා අධිකරණ බලතල සහිත කොමිෂන් සභාවක් පත් කෙරෙන අතර නීති විරෝධී කටයුතුවල යෙදුණ අයට දඬුවම කෙරේ.''

වසර 2500ක මහා ඉතිහාස වංශ කතාව වමාරා කමින් කට පාඩම් කොටගත් සමාජයකට දත-පහළොස් වසරක ඉතිහාසය අමතකව ගොස් තිබේ. දෙසැම්බර් 06 වෙනිදා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යළි බල ගැන්වීම පිළිබඳ ඉමහත් අමන්දානන්දයට පත් ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් 'මේ පනතෙන් පමණක් සැහීමකට පත්වන්නට බැරි බව' මානව හිමිකම් දිනය යෙදුණු ඉකුත් ඉරිදාවේ 'ලංකාදීප'යට කියා තිබිණ. එදිනම 'මව්බිම' පත්‍රය සමග සම්මුඛ සාකච්ඡාවකට එළඹුණු ජවිපෙ දේශපාලන මණ්ඩල සභික අනුර කුමාර දිසානායක මෙසේ කියා තිබිණ: ''මේ අවස්ථාවේ ත්‍රස්තවාදය පරාජය කිරීමට පියවර ගත යුතු වෙනවා. එහිදී ත්‍රස්තවාදය මේදනය කිරීම ඉළක්ක කොටගත් නීති හඳුන්වා දිය යුතු වෙනවා. රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝණය නොවන අයුරින් හා ජනතාවගේ හා කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් හානි නොවන අයුරින් කටයුතු කිරීමට ආණ්ඩුවට වගකීමක් තියෙනවා.'

'ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට හානි නොවන අයුරින් රාජ්‍ය මේදන යන්තය ශක්තිමත් කිරීමේ' සැලසුම් කළින් දැන සිටියේ නම් ඉල්මහ සමරුවත් අනවශ්‍ය වන්නට ඉඩ තිබිණ. සෙස්සන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයට අත නොතබා දෙළොලගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් මැසැලීමේ මාරාන්තික බොරුව අතීතයේදී පුපුරවා දැමුණේද දකුණේ 60,000 කගේ ළලෙකඳන් වලිකි. මේධකයාගේ දෘෂ්ටි කෝණයෙන් බැලූ කල ඒ 60,000 ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ අර්ථ දැක්වීමටලට ගැළපෙන ත්‍රස්තයින්ය. මළවුන්ගෙන් උගත් පාඩම් කසළ කඳු සේ සාමූහික මතකයෙන් අතු ගා දැමූ දශකයක් අවසානයේ 'කොටි පනතක්' යළිත් දැන් අපට ලැබී තිබේ. දකුණේ පැතිරෙන අත්පොසසන් හඬ ඒ නිසාය. යුක්තිය පතන දෙමළ පීඩිතයාට කපන මිනිවළටම ඔහුව පසුව ඇද වැටීම වරපුසාදයක් සේ දැන් බොහෝ දෙනා සැලකති.

ලංකා ඊ නිව්ස් අනුග්‍රහයෙනි

සන්නස

වෙළඳ දැන්වීම් සඳහා අමතන්න

03 9402 5380

0425 720 932

U.D. Electricals

ඔබේ සියළුම ගෘහ විදුලි අවශ්‍යතා සඳහා

බලයලත් විදුලි ශිල්පී

Registered Electrical Contractors and Licenced Electrician (Rec 17240)

Down lights, Sensor lights, Heter lights, Upgradig fuse boards

Power points, Exhaust fans, Safty switches,

All Electrical Work

Call Upali 0422 052 425/ 03 97056697

Narre Warren

Reasonabe Rates + All Work Gurenteed